Institute for Research & Development
in Health & Social Care
"Working towards developing research culture in Sri Lanka"

Address : No. 393/3, Lily Avenue,
Off Robert Gunawardhane Mawatha,
Battaramulla, 10120, Sri Lanka.
Telephone: +94 11 2863084, +94 11 5662895
Fax : +94 11 2863084
E-mail : info@ird.lk
Web : www.ird.lk

ජනමාධ්‍ය නිවේදනය

**2021.06.01**

සියලුම ජනමාධ්‍ය ආයතන වෙත.

# මෙරට කොවිඩ් 19 ප්‍රතිශක්තිකරණ එන්නත ලබා ගත් අයගේ අතුරු ආබාධ පිළිබඳ ව කරනු ලබන සමීක්ෂණයට තම අත්දැකීම් ලබා දෙන ලෙස එන්නත ලබා ගත් අයගෙන් කරනු ලබන කාරුණික ඉල්ලීම

කොවිඩ්-19 වසංගත රෝගය සහ ඉන් ආරක්ෂා වීම, දැනට ලෝකයේ වඩාත්ම අවධානයට ලක් වී ඇති කාරණාවයි. ඒ යටතේ ප්‍රතිශක්තිකරණ එන්නතට ලැබී ඇති අවධානය ඉතා ඉහලය. නමුත් ඇති විය හැකි අතුරු ආබාධ පිළිබඳ ව ලොවට ඇත්තේ අඩු දැනුමකි. එහෙත් එන්නත් නිපදවූ රටවල ජනතාවට එන්නත් ලබා දීමෙන් පසුව එම ජනතාව තුල ඇතිවූ අතුරු ආබාධ පිළිබඳ සීමිත හෝ තොරතුරු ඇතත් ඒවා ඒ ලෙසටම ශ්‍රී ලාංකීය ජනතාවට ආදේශ කළ නො හැක. මන්ද ලෝකයේ විවිධ රටවලට අදාළව එන්නත්වල අතුරු ආබාධ වල ස්වරූපය හා බලපෑම රටින් රටට වෙනස් විය හැකි බැවිනි. බොහෝ රටවල් ක්ෂණික ක්‍රියාමාර්ග ලෙස ඒ පිළිබඳව පර්යේෂණ කර එම දැනුම තම රටවල ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය උපරිම අයුරින් ඉහළ නැංවීම සඳහා යොදාගනිමින් පවතී.

අප රට තුලද මෙය කාලීන අවශ්‍යතාවයකි. මේ නිසා දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් විද්වතුන් කණ්ඩායමක් විසින් කරනු ලබන මෙම සමීක්ෂණයේ දත්ත විශ්ලේෂණයෙන් හෙළිවන නවතම කරුණු සෞඛ්‍ය අමාත්‍යාංශය හා කොවිඩ් 19 වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය සමඟ බෙදා ගැනීමට අපි අපේක්ෂා කරන්නෙමු.

අප ආයතනය මෙරට දේශීය පර්යේෂණ සංස්කෘතියේ දියුණුව උදෙසා ක්‍රියා කරනු ලබන දේශීය සහ අන්තර් ජාතික පර්යේෂණ ජාලයකින් සන්නද්ධ ආයතනයකි. අපගේ www.ird.lk වෙබ් අඩවියට පිවිසීමෙන් මේ සම්බන්ධව උනන්දුව දක්වන ඕනෑම කෙනෙකුට එම තොරතුරු ලබා ගත හැක.

මෙම වැදගත් පර්යේෂණය සඳහා මෙරට කොවිඩ් 19 ප්‍රතිශක්තිකරණ එන්නත් (ඇස්ට්‍රාසේනිකා, ස්යිනොෆාම් හෝ ස්පුට්නික් V එන්නත් වලින් කුමන හෝ එන්නතක්) ලබා ගත් පුද්ගලයන්ගේ අත්දැකීම් කෙටි ප්‍රශ්නාවලියක් මගින් අන්තර්ජාලය ඔස්සේ ලබා ගන්නා අතර මේ සඳහා ස්වේච්ඡාවෙන් සම්බන්ධ විය හැක. මෙම සමීක්ෂණයේ වැදගත්කම හා කාලීන අවශ්‍යතාවය හඳුනා ගත් එම එන්නත ලබා ගත් පුද්ගලයන්ගේ සහයෝගය අවශ්‍ය ව ඇත.

ඒ සඳහා මහජනතාව ඉක්මනින් දැනුවත් කිරීමට අවශ්‍යව ඇති අතර ඔබ මාධ්‍ය ආයතනයේ උපරිම පුළුල් මාධ්‍ය ප්‍රචාරණය ඒ සඳහා බලාපොරොත්තු වෙමි.

Institute for Research & Development
in Health & Social Care

"Working towards developing research culture in Sri Lanka"

Address : No. 393/3, Lily Avenue,
Off Robert Gunawardhane Mawatha,
Battaramulla, 10120, Sri Lanka.
Telephone : +94 11 2863084, +94 11 5662895
Fax : +94 11 2863084
E-mail : info@ird.lk
Web : www.ird.lk

අන්තර්ජාල සබැඳිය

English - https://forms.gle/4DGZMbtJWyzX9iNS7

Sinhala - https://forms.gle/tyW1c5R7XruFFaPd7

වැඩි විස්තර සඳහා දුරකථන අංකය : 076 050 34 34 (ලසිත් දිසානායක)

විද්‍යුත් තැපැල: info@ird.lk

ස්තුතියි.

මහාචාර්ය අතුල සුමතිපාල

අධ්‍යක්ෂක, පර්යේෂණ හා සංවර්ධන ආයතනය

කමිටු සාමාජික, කොවිඩ් 19 වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය

මනෝ චිකිත්සාව පිළිබඳ මහාචාර්ය, කීල් විශ්වවිද්‍යාලය, එංගලන්තය

ගෞරවනීය උපදේශක මනෝචිකිත්සක, මිඩ්ලන්ඩ්ස් හවුල්කාරිත්වය එන්එච්එස් පදනම් භාරය.

ගෝලීය මානසික සෞඛ්‍ය පිළිබඳ මහාචාර්ය, කිංග්ස් විද්‍යාලය, එංගලන්තය

සභාපති, ජාතික මූලික අධ්‍යයන ආයතනය, මහනුවර

මනෝ චිකිත්සාව හා ජෛව වෛද්‍ය පර්යේෂණ පිළිබඳ මහාචාර්ය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

Winner

National Awards for Science and Technology Achievements 2018

"Excellence in international collaboration for advancement of Science and Technology"

"Outstanding leadership in promoting and developing Science and Technology"